**මන්නාරම නගර සභාව**
**මන්නාරම දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කරතිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**-------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) සභාවේ ප්‍රධාන ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය ස්ථාවර වත්කම්වල සංචලනය රු. 89,422,981 ක් වූවද, මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස රු. 83,418,828 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් රු. 6,004,159 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු. 92,500 ක්වූ සේවක ඇප තැන්පත් ගිණුමේ හිඟ ශේෂය සමුච්චිත අරමුදලට හර කර තිබීමෙන් සමුච්චිත අරමුදල රු. 92,500 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර, සේවක ඇප තැන්පත් ගිණුම මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබුණි.

#### 1.3.3 නොසැසැඳුණු ගිණුම්
**----------------------**

සමාලෝචිත වර්ෂයේ සභාවේ ප්‍රධාන ලෙජරයේ ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අයිතම් තුනක හිඟ ශේෂවල එකතුව රු. 228,381 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**ගෙවිය යුතු ගිණුම්**

එකතුව රු. 2,576,048 ක් ගෙවිය යුතු ගිණුම් තුනක් පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා නිරවුල් කිරීමට කටයුතු නොකිරීමට හේතු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

ඉඩම් ඔප්පු, ණය කාල විශ්ලේෂණ සහ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රුපියල් මිලියන 342.59 ක ගනුදෙනු තුනක් විගණනයේදී සතුටු දායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | නගර සභා ආඥා පනත පරිච්ඡේදය 255 වගන්තිය 160 | 10,734,156 | හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි 371 | 1,693,168 | සභාවේ නිලධාරීන්ට සහ වෙනත් පාර්ශවයන්ට විවිධ ක්‍රියාකාරකම් සඳහා අවස්ථා 13 කදී ගෙවා තිබූ අත්තිකාරම් මුදල් පසුගිය වර්ෂ 5 සිට 33 දක්වා නිරවුල් කරගෙන නොතිබුණි. |
| (ඇ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2017 මැයි 17 වන දිනැති ඉන්පිල් / 15/5/සෙපරේෂන්/යූ අංක දරන චක්‍රලේඛය | - | කසළ වර්ගීකරණය කර පැටවීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 50,079,801 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 27,014,174 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 17,080,000 | - | 18,324,367 | 16,093,904 | 1,260,000 | - | 1,301,281 | 4,494,798 |
| (ii) | කුලී | 22,309,300 | - | 30,760,213 | 2,020,990 | 19,521,400 | | 24,981,997 | 1,673,830 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,010,000 | - | 1,240,841 | - | 3,055,000 | | 3,593,588 | - |
| (iv) | වෙනත් ආදායම් | 11,987,250 | - | 21,273,993 | 21,242,002 | 4,015,000 | | 5,901,914 | 37,828,591 |

### 2.2.2 වරිපනම්

එකතුව රු. 6,614,797 ක්වූ හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

### 2.2.3 කුලී

එකතුව රු. 501,415 ක්වූ හිඟ කුලී අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු. 15,081,916 ක් විය.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්‍ය සාධනය**

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසල බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.
(ii) සෞඛ්‍ය කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණවලට භාජනයකර නොතිබුණි.
(iii) අපද්‍රව්‍ය වර්ගීකරනය කර ලබා ගෙන නොතිබුණි.
(iv) නිලධාරින්ට අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ පුහුණු ලබාදී නොතිබුණි.
(v) අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු හා දත්ත ක්‍රමයක් පවත්වා නොතිබුණි.
(vi) ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයෙන් තොරව පරිසරය දූෂණය වන ආකාරයට ගිණි තබා පුළුස්සනු ලැබේ.
(vii) කසල කළමනාකරණය සඳහා වැයවන මුදල් ප්‍රමාණය රැස්කර ගැනීම සඳහා කසල බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**(ආ) පාරිසරික කටයුතු**

පහත කරුණු නිරීක්ෂණ විය.

(i) මන්නාරම කිරිවෙරළ, වෙරළ උද්‍යානය සහ නාගරික පොදු වැසිකිළිය යන ස්ථාන නිසි පරිදි නඩත්තු නොකිරීමෙන් සෞඛ්‍යට බලපෑම් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.
(ii) පල්ලිමුනෙහි තිබෙන බෝබබ් ගස සහ එහි අවට පරිසරය නවීකරනය කර නඩත්තු කිරීමට සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

සමාලෝචිත වර්ෂයේදී මහජනතාවගෙන් ලැබී තිබූ වීථි ලාම්පු සවිකිරීම් පිළිබඳ පැමිණිලි 17 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

විශ්‍රාම ගිය සහ සේවයෙන් පහකරන ලද නිලධාරින් පස්දෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු. 509,409 ක්වූ හිඟ සේවක ණය ශේෂය අයකර ගැනීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3.4 අධි ගෙවීම**

සමාලෝචිත වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ආධාර යටතේ එකතුව රු. 5,240,866 කට ඉටුකරන ලද පරණ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු. 196,892 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

සභාවේ කටයුතු විගණනය කර එහි ක්‍රියාකාරකම් කාර්යක්ෂතාවයෙන් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනය පරීක්ෂණවලින් ලද නිර්දේශයයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම් අතර රු. 7,982,141 ක අහිතකර විචලනයක් නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලනය**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ප්‍රධාන ලෙජරය නිසි පරිදි නඩත්තුකර නොතිබුණි. |
| (ආ) ආදායම් | දේපළ තක්සේරුකර වරිපනම්බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ලැබිය යුතු ගිණුම් | හිඟ ආදායම් සහ ගාස්තු අයකිරීම සඳහා ආදායම් පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඈ) වත්කම් | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, මාර්ග, සුසානභූමි, සාතකාගාර බලපත්‍ර ගාස්තු ලේඛන ගත කර නොතිබුණි. |